# Living the Lotus

## Buddhism in Everyday Life

8
2025
VOL. 239



## Rissho Kosei-kai of Hawaii Hosts Bon Dance Festival on July 11–12







**Living the Lotus**
**Vol. 239 (August 2025)**

Senior Editor: Keiichi Akagawa
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

# 'ප්‍රශංසාව' පමණක්ම සිදු කරන්න

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## මානව සම්පත් සංවර්ධනයේ පදනම

මා අධ්‍යයනය කරන ග්‍රන්ථ ආදිය රචනා කල අධ්‍යාපනඥයින් දෙදෙනෙක් අතර පොදු දර්ශනයක් පවතී. එනම්, අධ්‍යාපනය යනු දේශනයන් සිදු කිරීම පමණක් නොව, ප්‍රශංසාවද සිදු කළ යුතුය යන සංකල්පයයි. ඔවුන්ගෙන් එක් අයෙක් වන නොබුසෝ මොරි මහතා, ගුරුවරුන් ප්‍රශංසා කිරීමට පමණක් තම මුඛය භාවිතා කල යුතු බවද පවසයි.

උදාහරණයක් ලෙස, ජපානයේ පාසල්වල පාවහන් තබන රාක්කයේ ඇති පාවහන් පිළිවෙලට තබා නොමැති අවස්ථාවලදී, සිසුන්ට නොපෙනෙන අවස්ථාවක් බලා ඒවා නිසි ලෙස සැකසීම ගුරුවරයාගේ කාර්යය වේ. එසේ නිසි ලෙස පිළිවෙලට තබා ඇති පාවහන් දකින් සිසුන්, ඉන් පසු තමන් විසින්ම පිළිවෙළට තැබීමට පටන් ගනියි. එවිට ගුරුවරයා කලයුත්තේ, ඒ පිළිබඳව ප්‍රශංසා කිරීමයි. මෙය අධ්‍යාපනය වනවා සේම, මාර්ගෝපදේශනය ලෙස හැඳින්වේ.

තවද, කියෝතො විශ්ව විද්‍යාලයේ හිටපු කුලපතිවරයෙකු වන කෝ හිරසවා මහාචාර්යවරයා විසින් 'අධ්‍යාපනය යනු අන් අයට ප්‍රශංසා කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයයි' යනුවෙන් ප්‍රකාශ කර ඇත. මෙහිදී, 'සියල්ලටම වඩා වැදගත් වන්නේ, මිනිසුන්ට ජීවය ලබා දීමයි. එසේම, ඔවුන්ට සතුට, ධෛර්යය සහ බලාපොරොත්තු ලබා දීමයි' යනුවෙන් එතුමා විසින් රචිත ග්‍රන්ථයක ප්‍රශංසාවේ වැදගත්කම සඳහන් කර ඇත.

මම මේ දක්වා නොකඩවා 'මානව සම්පත් සංවර්ධනය තුලින්, අන්‍යයන් ගැන සිතනා මෛත්‍රියේ හදවතින් යුතු පුද්ගලයන්ව නිර්මාණය කරමු' එසේම, 'අනාගතයට නායකත්වය දෙන පුද්ගලයන්ගේ මනසට ආශ්වාදයක් ලබා දීම සහ පෝෂණය කිරීම' වැනි මානව සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් පැමිණියෙමි. එයට හේතුව සියලුම පුද්ගලයන්ගේ හදවත්වල සුන්දරත්වය මඟින් සුන්දර පෘථිවිය ආරක්ෂා කර, එහි සමගියෙන් ජීවත් වන සියලුම ජීවීන්ගේ සතුටට මග පෑදීමයි. අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ, ආගම සහ දර්ශනය පිළිබඳ මනා දැනුමක් ඇති ඉහත සඳහන් කල අධ්‍යාපනඥයින් දෙදෙනා මානව සම්පත් සංවර්ධනය කිරීමේ පදනම 'ප්‍රශංසා කිරීම' පමණක්ම බව පවසයි.

තවද, හිරසවා මහාචාර්යවරයා විසින් පැවසූ 'ඔබගේ මනස තුළ, ඔබ දන්නා ප්‍රමාණයට වඩා කිහිප ගුණයකින් වැඩි අපූරු දේවල් සැඟවී පවතී. කෙසේ හෝ, විශ්වාසයෙන් සහ ගෞරවයෙන් යුතුව

ඒවා ක්‍රියාවට නඟන්න' යන කියමනක්ද පවතී. මෙය අධ්‍යාපනික අර්ථයෙන් ප්‍රශංසාවක් නම්, මානව සම්පත් සංවර්ධනය කිරීම යනු, බුද්ධ ස්වභාවය අවධි කිරීමයි. එසේම යමෙකුට ප්‍රශංසා කිරීම යනු ඔවුනගේ බුද්ධ ස්වභාවය විශ්වාස කිරීම බවයි මට සිතෙන්නේ.

## විශ්වාසයෙන් යුතුව වන්දනාමාන කරමු

කෙසේ වුවද, ප්‍රශංසා කිරීම ඉතා දුෂ්කර දෙයකි. ඒ වෙනුවට, අප බැන වැදීමට සහ මැසිවිලි නැගීමට වැඩි නැඹුරුතාවයක් දක්වන්නෙමු. බැන වැදීමෙන් දරුවන්ව වුවද ඇතිදැඩි කල හැක්කේ වයස අවුරුදු 3ක් වන තෙක් පමණක් වන අතර, විශේෂයෙන් ඔවුන් වැඩිහිටියන් වූ පසු කොතරම් බැන වැදුණත්, අවවාද කලත් හොදටම එය සිතට දැනෙන්නේ නොමැති නම්, පවසන වැදගත් දේ පවා නොතේරෙයි.

එසේනම් අප කුමක් කල යුතුද? 'කරලා පෙන්වමින්, ඇසීමට සැලසීමෙන්, තනිව කිරීමට ඉඩදීමෙන් හා ප්‍රශංසා කිරීමෙනුයි මිනිස් සිත චලනය වන්නේ'  යන යමමොතො ඉසොරොකු ගේ කියමනට අනුව, යමෙකුට බැන වැදීමට ප්‍රථමව, යමක් කරන්නේ කෙසේදැයි ඔවුන්ට පෙන්වා දී, ඔවුන්ට එය කල හැකි වූ විට ප්‍රශංසා කිරීම තුළින් සිත චලනය කරනවා යැයි සිතමි. කෙසේ වුවද, මෙම කියමනෙහි අවසාන කොටසේ 'මිනිසුන් යමක් කරන විට එයට කෘතවේදී වී විශ්වාසයෙන් ඍකනොගන්නේ නම්, ඔවුන් ඵලදරන්නේද නොමැත' යනුවෙන්ද සඳහන් වේ. තවද, අන් අයගේ බුද්ධ ස්වභාවය කෙරෙහි පූර්ණ විශ්වාසය තබා ගැනීම සහ එම බුද්ධ ස්වභාවයට ගෞරව කිරීම, මානව සම්පත් සංවර්ධනයේ වැදගත්ම අංගයකි. තවද, මෙහිදී 'ඔබව අවශ්‍යයි' යන ආදරය සහ විශ්වාසයද අපට දැකගත හැකිය. මෙම අන්තර්ක්‍රියාව තුලින් තම වටිනාකම අවබෝධ වී, ජීවත්වීමේ සතුට, බලාපොරොත්තු සහ ධෛර්යය ලබා දෙන අතර, ඒ සමඟම 'මට ඒ පුද්ගලයා වාගේ වීමට අවශ්‍යයි' යනුවෙන් ප්‍රාර්ථනා කිරීමටත් මඟ පාදයි.

ධර්ම ශාඛා ප්‍රධානී කෙනෙකු විසින් ' මට සාමාජිකයන්ගෙන් ඇසීමට ලැබෙන දේ තුලින්, ලැබූ ආනිශංස ගැන නැවත ඔවුනට පැවසීම, ප්‍රශංසා කිරීමක් වනවා' ලෙසින් පවසයි. මෙය, තමන්ගේ සහ අන් අයගේ බුද්ධ ස්වභාවය විශ්වාස කරමින් ගෞරව කිරීමට තරම් අවංක හදවතක් නොමැති නම්, අන් අයව ප්‍රශංසා කල නොහැක යන වැදගත් පාඩම උගන්වනු ලබයි.

අප දිනපතා මෙවැනි උත්සාහයන් තුළින් මානව සම්පත් සංවර්ධනය කරගනිමින්, මිනිසුන් ලෙස සාර්ථක වීමට බලාපොරොත්තු වන අපව, බුදුන් වහන්සේත් සැම විටම දිරිමත් කර ප්‍රශංසා කරනු නොඅනුමානය.

'කෝසෙයි' අගෝස්තු කලාපය ඇසුරිණි



Interview

# බුදුන් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව තමා වෙනස් වීමට උත්සහ කිරීම තුලින් ජීවිතය වෙනස් වේ.

## සිම් හන්ද මහත්මිය
## ඉන්දියාවේ දිල්ලි ශාඛාව

**ඔබ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වූයේ කෙදිනක කුමක් හේතු කරගෙනද?**

මම 2004 අවුරුද්දේ ඔක්තෝබර් මාසයේදී, හිතවතෙකුගේ ආරාධනයකට අනුව දිල්ලි ශාඛාවට (එවකට දිල්ලි ධර්ම මධ්‍යස්ථානය ලෙස හැඳින්වූ) සම්බන්ධ වුවා. එයට හේතුවනම්, ආධ්‍යාත්මික වර්ධනය වෙනුවෙන් මා තුල තිබුණු ආශාවයි. එම ආශාව මාතුල ඇතිවීමට ඒ මොහොත දක්වා මගේ ජීවිතයේ කටුක සිදුවීම් විශාල බලපෑමක් වුවා. මම 1965 අවුරුද්දේ නව දිල්ලියේදී උපත ලැබූ අතර, මගේ දෙමාපියන්ගෙන් ලැබුණු අසීමිත නිදහස නිසා, කුඩාකල සිටම මම ආත්මාර්ථකාමීව මට ඕනෑ ආකාරයට ජීවත්වූවා. පසුව මම වයස අවුරුදු 24 දී විවාහ වූ අතර, මට පුතාල දෙන්නෙක් ලැබුණා. නමුත් මගේ හැසිරීම් නිසා දරුවන්ට මානසිකව විශාල පීඩනයක් ඇතිකලා. 1998 අවුරුද්දේදී මගේ ගර්භාෂයේ සැත්කමක් සිදු කල අතර, ඔස්ටියෝපොරෝසිස් හැදුණා. 2001 අවුරුද්දේ දී, වාහන අනතුරකින් මගේ කකුලක් කැඩුණා, 2003 අවුරුද්දේ මට පිළිකාවක් ඇති බවට සොයාගත් අතර, මගේ ආදරණීය අම්මාත් එම වසරේදීම මියගියා. ජීවිතය තුල ඉතාමත් වේදනාකාරී සිදුවීම් රැසකට මුහුණ දුන්නා. එම සිදුවීම් වලින් පසු මගේ ජීවිතය ගැන දුක් වුනා. මෙතරම් වේදනාකාරී අවාසනාවන්ත සිදුවීම් මටම සිදුවන්නේ ඇයිදැයි කියා මම කල්පනා කරන්න පටන් ගත්තා.

කෙසේ වෙතත්, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වීමෙන් පසු, එවකට ශාඛා ප්‍රධානී ප්‍රදීප් සක්සේනා මහතා සහ දකුණු ආසියානු කාර්යය මණ්ඩල ප්‍රධානී තෙරුවෝ සයිතෝ මහතා සමග වූ හමුවීම මගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස්කලා. සද්ධර්ම පුණ්ඩරීක සහ රිෂ්ෂෝ කෝසෙයිකායි හි ඉගැන්වීම් උනන්දුවෙන් අධ්‍යනය කරන විට සෑම හමුවීමක් සහ සිදුවීමක් තුලම ඉගෙනීමට වැදගත් යමක් ආලෝකයක් තිබෙන බව වැටහුණා. දුක්බිත සිදුවීම් වෙනුවෙන් අන් අයට සහ පාරසරික තත්වයන්ට දොස් පැවරීමෙන් ඵලක් නොවන බව වටහා ගත්තා. තමන් වෙනස් වනවානම්, තම ජීවිතය ආලෝකමත් කරගත හැකිබව මම ඉගෙන ගත් අතර මට වෙනස් වන්න හැකියාව ලැබුණා.

**වර්තමානයේ ධර්ම නායකයෙකු ලෙස ඔබ ලබපු ප්‍රීතිමත්ම අත්දැකීම කුමක්ද ?**

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් වලට අනුව, දුකට පත්වී සිටින සාමාජිකයින්ව දුකින් මුදවා ගැනීමට හැකිවීම සහ ඔවුන්ගේ සිනහව දැකීම මගේ ලොකුම සතුටයි. එම සාමාජිකයින් දුකින් මිදී සිනාසෙන් විට, ඔවුන්ගේ හදවත් තුල වැඩසිටින බුදුන් වහන්සගේ කරුණාවේ බීජයන් ධර්ම වැස්සෙන් නැහැවී, ධර්මයට අනුව ජීවිතය තුල ප්‍රිතිමත් මල් හටගන්නා බවක් මට හැගෙනවා.

**දිල්ලි ශාඛාවේ මේ දිනවල සිදුකෙරෙන ක්‍රියාකාරකම් මොනවාද?**

උදෑසන සහ සවස ධර්ම ශාඛාවේ සූත්‍ර සජ්ජායනයන් සිදු කරන අතර, දහවල් කාලයේදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන සහ සූත්‍ර සජ්ජායනයේ ක්‍රියා පිළිවෙත් ගැන උගන්වමින් කටයුතු කරනවා. මීට අමතරව, පවුල් අධ්‍යාපන හෝසා පවත්වන අතර, වැඩිහිටි නිවාසවලට උදවු කිරීමට යාම වැනි සමාජීය ක්‍රියාවන්ද සිදු කරනවා. විශේෂයෙන්, ධර්ම ශාඛාව අවට විශාල ලමුන් පිරිසක් අධ්‍යාපනය නොමැතිකම නිසා ලිවීමට කියවීමට නොහැකිව සිටිනවා. එම දරුවන්ට අවශය පොත්පත් පාසල් උපකරණ ආදිය ලබාදෙන අතර, අපගේ තරුණ නායක නායිකාවන් එක්ව ධර්ම ශාඛාවේ හෝ අසල උද්‍යානයකදී හින්දි භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව උගන්වනවා. දරුවන් තුල ජීවත් වීමට අවශය දැනුම වර්ධනය කිරීම මෛත්‍රී කිරීමේ එක් ක්‍රියාකාරකමක් යැයි අපි සිතනවා.

**ඔබේ හදවත කැටයම්කල සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් මොනවාද?**

මට ඖෂධ වේදියෙකු ලෙස කටයුතු කර අත්දැකීම් තිබෙන නිසා, සද්ධර්ම පුණ්ඩරීක සූතයේ ඖෂධ



දිල්ලි ධර්ම ශාඛාවේ සාමාජිකයින් අමතමින් සිටින සිම් හන්ද මහත්මිය



2022 අවුරුද්දේ දිල්ලි ශාඛාවේ පැවති බුද්ධ ප්‍රතිමා ප්‍රධානෝත්සවයෙන් පසු බුද්ධ ප්‍රතිමා ලබගත් පිරිස සමග (ඉදිරි පේළියේ වම් කෙලවරේ සිම් මහත්මිය)

පැළෑටි උපමාවේ පරිච්ඡේදය ගැන උනන්දුවක් දක්වනවා. මේ ලෝකය තුල විවිධාකාරයේ ගස් වර්ග තණකොළ වර්ග තිබෙන අතර, ඒවා වෙනස් ලෙස පෙනුනත් ඒමතට එක සමානව වැසි වැටෙනවා. එසේ වුවත් එක් එක් ශාකය තමාට අවැසි පරිදි ජලය උරාගෙන වර්ධනය වේ. මල් පිපෙයි එල දරයි. මිනිසුන් ගත් කලද එය එසේම වන අතර, මිනිසුන්ට විවිධ හැකියාවන් සහ ගුණධර්ම තිබුණත් බුදුන් වහන්සේගේ ධර්මය ඉගෙනීමට, බුද්ධත්වය සාක්ෂාත් කරගැනීමේ හැකියාව සියලුම දෙනාට සමානව තිබෙනවා. සියලුම දෙනා තුල සාමනවූ බුද්ධ ශක්තියක් තිබෙනවා, නමුත් මනුෂයන් ලෙස ඉපිද සිටියත් එය අවබෝධ නොවූ පිරිස විශාලයි. එහි ප්‍රතිඵලයක් ලෙස විශ්වාසය නොමැතිවීම, ධනාත්මකව ජීවත්වීමට නොහැකිව තිබෙනවා යැයි මම සිතනවා. එනිසා මම ධර්ම ශාඛාව අවට දරුවන්ට ‘ඖෂධ පැළෑටි උපමාව’ තේරුම් ගැනීමට පහසු ආකාරයට උගන්වනවා. බුදුන් වහන්සේගේ මහා කරුණාවනම් වැස්සේ තෙමෙමින්, අන් අය සමග තම ජීවිතය සංසන්දනය නොකරමින්, තම හැකියාවන් වටහාගෙන ලස්සන මලක් මෙන් ජීවිතය පුබුදුවා ගනීවී යැයි මම ප්‍රාර්ථනා කරනවා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් වලින් ඔබ වඩාත් ප්‍රිය කරන කරුණ කුමක්ද?**

නිර්මාතෘ තුමා වයස අවුරුදු 16 දී තෝකියෝ බලා පිටත්ව යන අවස්ථාවේ අධිෂ්ඨාන හයක් සිතෙහි තබාගත් අතර, ඉන් එකක් වන ‘අන් අය සමග ගැටුමට නොයමි. කෙතරම් අපහසු දෙයක් සිදු වුවත් එය බුදුන් වහන්සේ දෙවියන් වහන්සේගෙන් ලැබෙන දෙයක් යැයි සිතා ඉවසීමෙන් කටයුතු කරමි’ යන්න මම වඩාත් ප්‍රිය කරන අතර හොඳින් මතකයේ තබාගෙන සිටිනවා. අනාගතයේ මට කුමනාකාරයේ දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදු වුවත්, එම දුෂ්කරතා මාව වර්ධනය කරනවා යැයි මම සිතනවා. සියල්ල බුදුන් වහන්සේ විසින් සූදනම් කර දෙනවා යැයි පිළිගෙන බුදුන්ගේ ආලෝකයෙන් ශක්තිමත්වී දිගටම ධර්ම පුහුණුවේ යෙදෙමි.

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ආකර්ෂණීය යැයි ඔබ සින්නේ කුමක්ද?**

හෝසා යනු රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ‘ජීවය’ යැයි හදුන්වනවා. මගේ අත්දැකීම් වලට අනුව හෝසා යනු, බුදුන් වහන්සේගේ ධර්මයට අනුව දේවල් දැකීමට සහ තම චරිතය ඔප්නංවා ගනිමින් තමාව වර්ධනය කර ගැනීමට එකිනෙකාගෙන් ඉගෙන ගන්නා විශිෂ්ඨ ප්‍රායෝගික පුහුණුවක් යැයි සිතනවා. කෝසෙයි කායි හා සම්බන්ධ වීමෙන් ටික කලකට පසුව මට මගේ දුක් වේදනාවන් පැවසීම ඉමහත් වූ ධෛර්යයක් අවශය වූවා. අන් අය තම ගැටළු වලට සවන් දේවී, තමාව තේරුම් ගනීවී යැයි මිනිසුන්ට විශ්වාස කරන විට, සැනසීමෙන් යුතුව තව හැගීම් ප්‍රකාශ කිරීම පහසු වනවා. හෝසා වලදී ධර්ම මිතුරන් එකිනෙකාගේ දුක්වේදනාවන් තමන්ගේ කරදර ලෙස දයානුකම්පිතව සිතා සහයෝගය ලබාදෙනවා. ධර්ම මිතුරන්ගෙන් ලැබෙන මෙම සහයෝගය සහ දිරිගැන්වීම නිසා හදවත විවර කිරීම ගැන බියවිය යුතු නැතැයි මම විශ්වාස කරනවා. බුදුන් වහන්සේගේ ධර්මයට අනුව තමාව වෙනස්කර ගැනීමට උත්ස කිරීමෙන්, තම ජීවිතය වෙනස්වන අතර, විශ්වාසයෙන් යුතුව ධෛර්යයෙන් බුද්ධ මාර්ගයේ ගමන් කිරීමට හැකියාව ලැබෙනවා. ඒ වගේම හෝසා වටය තුල බුදුන් වහන්සේගේ ධර්මය ජීවමාන වන අතර, එකිනෙකාගේ අනුකම්පාව දැනෙනවා තම හදවත වෙනස් කරගැනීමට හැකිවනවා ඒ තුලින් ජීවිත මල් මෙන් පුබුදුවාලීමට හැකිවනවා යැයි මම විශ්වාස කරනවා.



2024 අවුරුද්දේ කෝසෙයි කායි 86 වන සංවත්සර සැමරුමට සහභාගී වෙමින් දිල්ලි ශාඛාවේ සාමජිකයින් සමග කේක් කපන අයුරු (දකුණේ සිට දෙවැනියා)

**අවසාන වශයෙන් ඔබේ වර්තමාන අභිලාෂයන් සහ ධර්ම පුහුණුවේ අනාගත ඉලක්කයන් මොනවාද?**


මගේ ප්‍රධානම අරමුණ වන්නේ දිල්ලියේ සිටින ධර්ම මිතුරන් සමග බුදුන් වහන්සේගේ ධර්මයේ හරය වන මෛත්‍රිය සහ ප්‍රඥාව හැකි තරම් විශාල පිරිසකට ඉගැන්වීමයි. ධර්ම ව්‍යාප්ත කටයුතු වලට අමතරව ඊලග පරම්පරාවන්ට නායකත්වය වන දරුවන්ට අධ්‍යාපනික සහයෝගය සහ දිල්ලියේ සමාජ සංවර්ධනය වෙනුවෙන් දායක වීමට හැකි ලෙස උත්සහ කිරීම.




හන්ද පවුලේ දෙවන පුතාගේ විවාහ මංගල්‍ය සැමරීම (2023 අවුරුද්ද, දකුණු කෙළවරේ සිම් මහත්මිය)

## රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ පහසුකම්

### නිර්මාතෘ තුමා වෙනුවෙන් ඉදිකල කෞතුගාරය







**දැනුමට යමක්**

කෞතුකාගාරයේ එක් විශේෂිත ප්‍රදර්ශන කාමරයක් තිබෙන අතර, එය වසරකට කිහිප වතාවක් පමණක් ප්‍රදර්ශනය කරනු ලබයි. එහි නිර්මාතෘ තුමා, වකිසො සමා සහ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන ඇතුලත්, විවිධ තේමා අනුව නව කරුණු අවබෝධ කරගත හැකි නිස්කලංක පරිසරයකින් සමන්විත වේ. එහි පිවිසුම හෝරින්කකු උද්‍යානය පසින් පිහිට ඇත.

'නිර්මාතෘ තුමාව හමුවීමට, ඉගෙන ගැනීමට සහ නිර්මාතෘ තුමාට කතා කිරීමට හැකි ස්ථානයක්' ලෙස මෙම කෞතුකාගාරය 2006 අවුරුද්දේදී නිර්මාතෘ තුමාගේ 100 වන ජන්ම දිනය සනිටුහන් කරමින් නිර්මාණය කරන ලදි.


කෞතුගාරය මධ්‍යයේ නිර්මාතෘ තුමාගේ මෙම ගමනේ ආරම්භය, උපන් ගම සුගනුමාහි සෘතු හතර පෙන්වන සංකේතයක් නිර්මානය කර තිබෙන අතර, එය වටා නිර්මාතෘ තුමාගේ ජීවිත් කතාව විදහා දැක්වෙන් අදියර පහක් දැක්වෙනවා. නිර්මාතෘ තුමා වැඩකල කාමරයද ප්‍රති නිර්මාණය කර ඇති අතර, එහි එක් කෙලවරක ඔහුගේ පිලිරුවක් නිර්මාණය කර තිබීම විශෙෂත්වයක්.

නිර්මාතෘ කෞතුකාගාරය යනු විවිධ දර්ශන තුලින් ඔහුව හමුවිය හැකි ස්ථානයක්.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.


# දයිනිදන්සන් නැවතීමේ ශාලාව










දයිනිදන්සන් පරිශ්‍රය යනු රිෂ්ෂෝ කෝසෙයි කායි ප්‍රධාන ධර්ම මණ්ඩපය වන්දනා මාන කිරීමට පැමිණෙන බැතිමතුන් සඳහා නවාතැන් ගැනීමට නිර්මාණය කර ඇති ස්ථානයයි. එය විශාල පිරිසකට එකවර නවාතැන් ගත හැකි විශාල ගොඩනැගිල්ලක් වේ.

නිර්මාතෘ තුමාගේ සංකල්පයකට අනුව එහි ලොබිය, පූජනීය කඳු ලෙස සැලකෙන ගිජ්ජකූට පර්වතය, ටිඅන්තායි කඳු පන්තිය සහ හිඑ කන්ද සෙරමික් බිතුසිතුවමකින් අලංකාර කර තිබෙනු දැකගත හැක. මීට අමතරව ලෝකඩින් සාදන ලද නිර්මාතෘ තුමාගේ පිළිරුවක්ද එහි දැකගත හැකිවේ. බුදු දහමේ ආරම්භය දෙස නැවත බලා, බුදුන් වහන්සෙගේ හදවත මෙන් තම හදවත නිර්මාණය කරගනිමු යන නිර්මාතෘ තුමාගේ අධිෂ්ඨානය මේසිතුවම තුල ගැබ්ව ඇත.

**දැනුමට යමක්**

ඉන්දියාවේ පිහිටා ඇති ගිජ්ජකූට පර්වතය සහ චීනයේ ටිඅන්තායි කඳු පන්තිය පිහිටා ඇති අතර, ජපානයේ ෂිගා ප්‍රාන්තයේ හිඑ කන්ද පිහිටා තිබෙනවා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කල ස්ථානය ලෙෂ ගිජ්ජකූට පර්වතය සැලකෙන අතර, ඉන්දියාවේ සිට ජපානය තෙක් බුදු දහම පැමිණි මග ගත් කල ටිඅන්තායි කඳු පන්තිය වැදගත් තැනක් ගනී.

※ කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## බුදුන්වහන්සේගේ මෙන් පොහොසත් හදවතින්

# ධර්මය දේශනා නොකරන්නේ නම් ලෝකය විනාශ වේ

නික්යෝ නිවානෝ තුමා
නිර්මාතෘ, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



මුල සිටම හොඳින්ම ධර්මය දේශනා කිරීමට හැකියාවක් නොලැබේ. ඒ වෙනුවෙන් අත්දැකීම් අවශ්‍ය වේ. දුනු විදීමේදී පවා, ආරම්භයේ සිටම නියම ඉලක්කයට ඊතලය විදින අය නොසිටියි. එසේ නොවැදුනත්, කිහිප වතාවක් පුහුණුවීමේ යෙදෙන විට, ඉදහිට ඉලක්කයට විදීමට හැකියාව ලැබෙයි. එම පුහුණුව නොකඩවා සිදු කරන විටයි ඊතලය ඉලක්කයට වදින ප්‍රමාණය වැඩිකර ගැනීමට හැකිවන්නේ.

ඔම්විබිකි හා තෙදොරි කිරීමත් ඒ හා සමානයි. හෝසාවන් වලදී විශාල පිරිසකගේ දුක් වේදනාවන්ට සවන්දී, ඒ සඳහා ශාඛා ප්‍රධානී තුමා ලබාදෙන 'පිළිතුරු' වලට හොඳින් සවන්දී, නොකඩවා තෙදොරි හා මිච්බිකි කළ යුතුය. එසේ නියැලෙන විට, අන් පුද්ගලයන්ගේ මුහුණ දකින විටම, ඔවුන් ප්‍රකාශ කරන්නටත් පෙර 'මේ වගේ ප්‍රශ්නයක් ඔබට තියෙනවා නේද' යනුවෙන් ඉලක්කයට පැවසීමට හැකිවේ. ඉන් පසු, 'මෙලෙසින් ඔබේ සිතුවිලි වෙනස්කර ගන්නේ නම්, ඉක්මණින්ම සතුට උදාකර ගැනීමට හැකිවෙනවා' ලෙසින් විශ්වාසයෙන් පැවසීමට හැකිවේ.

ඒ නිසා නිතරම ධර්මය දේශනා කිරීමට උත්සහ ගන්න. නමුත් සවන් යොමු නොකරන පුද්ගලයන් වුවද සිටින්නට පුළුවනි. එසේම, හොඳින් සවන් යොමු කලත්, අවබෝධ කරගැනීමට උත්සහ නොකරන පුද්ගලයන්ද සිටියි. එබැවින් අසුභවාදීව නොසිතා, අගර්හීත බෝධිසත්වයන් මෙන්, 'ඔබට බුදු වීමට හැකියි' ලෙසින් නිරන්තරයෙන් අන්‍යයන්ට පැවසීමට හැකිවූ විට, තමන්ටත් අන්‍යයන්ටත් සත්‍යාවබෝධ කරගැනීමේ මාර්ගය විවර කරගැනීමට හැකිවන්නේ.

බුදුන් වහන්සේද බුද්ධත්වයට පත්වූ පසුව, තමන් අවබෝධ කරගත් 'මෙම ගැඹුරු ධර්මය දේශනා කලත් කාහටවත් නොතේරෙයි' යැයි සිතමින්, 'දේශනා කළ යුතුද, තමන් වහන්සේ ළඟම තබාගත යුතුදැයි' කල්පනා කලා.

එම අවස්ථාවේ, බුදුන් වහන්සේ වෙත පැමිණි සහම්පති බ්‍රහ්මයා විසින් 'මේ ලෝකය විනාශ වනවා. නිවැරදි ධර්මය අවබෝධ කරගත් තැනැත්තෙකු එම ධර්මය දේශනා නොකරන්නේ නම්, මේ ලෝකය විනාශ වනවා' ලෙසින් ධර්මය දේශනා කරන ලෙසට බුදුන් වහන්සේට ආයාචනා කලා.

ඒ ගැන ත්‍රිපිටකයේද සඳහන් වන අතරම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 'මායා නගරයේ උපමා කතාව' යන පරිච්ඡේදයේද ඒ ගැන සඳහන් වේ.


'බ්‍රහ්ම, දිව්‍ය රජවරු බුදුරදුන්ට ප්‍රශස්ති ගායනා කර යළිත් මෙසේ ප්‍රකාශ කර සිටියහ. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, සියළු සත්වයන්ට නිර්වාණ දොරටුව විවෘත කර ගැනීමට හැකිවන අයුරින් ධර්ම චක්‍රය ප්‍රවර්තනය කරන මෙන් අයැද සිටින්නෙමු.'

එනම්, බ්‍රහ්මනයන් විසින් 'බුදුන් වහන්සේ විසින් අවබෝධ කර ගත්තාවූ මෙම ''ධර්මය'' සියළු ලෝක සත්වයාව දුකින් මුදවා ගැනීම සඳහා දේශනා කරමින් සත්‍යාවබෝධය ලබා දෙන්න' ලෙසින් ආයාචනා කල බව එහි සඳහන් වේ,

එහිදී, 'නිවැරදි ධර්මය දේශනා නොකරන්නේ නම්, මේ ලෝකය විනාශ වේවි' ලෙසින් පැවසූ බ්‍රහ්මනයාගේ වදන්, මෙම 21 වන සියවසටද අදාළ වේවි යැයි සිතමි. අඩුම වශයෙන් 'ලද දෙයින් සතුටු වීම' පමණක්වත් ලෝක වැසියා හදවතට බද්ධ කරගෙන කටයුතු නොකරන්නේ නම්, මනුෂ්‍ය සංහතිය වඳවීමේ මාර්ගයට පිවිසෙනවා නොඅනුමානයි.

කෝසෙයි කායි සාමාජිකයන් වන ඔබ සියළුදෙනා එම වගකීම හොඳින් ධාරණය කරගෙන, ඉතාමත් උනන්දුවෙන් ධර්ම ව්‍යාප්තියේ යෙදිය යුතු වෙයි. එය සියළු ලෝක සත්වයාව දුකින් මුදවා ගන්නවා යන බුදුන් වහන්සේගේ හදවතට  සමීපවිය හැකි බෝධිසත්ව චර්යයාව බව විශ්වාස කරමි.

නික්යෝ නිවානෝ තුමා විසින් රචිත,
'යහපත් බවේ බීජයන් වපුරමු' ග්‍රන්ථයේ 81 - 83 පිටු ඇසුරිණි



# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අවබෝධවනවා යනු

කෙයිඉචි අකගාවා මහතා
රිෂ්ෂෝ කෝසෙයි කායි අන්තර්ජාතික මූලස්ථානය

සියළුදෙනාටම සුභ දවසක් වේවා. ජපානයේ නම් අකණ්ඩව දැඩි උෂ්ණත්වයක් පවතිනවා. එලෙසම ගිම්හාන කාලයේ ආර්ද්‍රතාවයද අධික නිසා, සෑම වසරකම වාගේම ශාරීරික සෞඛ්‍ය හොඳින් පවත්වා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වෙනවා.

මේ මාසයේ නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩය තුලින් 'අධ්‍යාපනය යනු අන් අයට ප්‍රශංසා කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයයි, මෙහිදී, 'සියල්ලටම වඩා වැදගත් වන්නේ, මිනිසුන්ට ජීවය, සතුට, ධෛර්යය සහ බලාපොරොත්තු ලබා දීමයි' සේ ඔකි හිරසාවා සෙන්සෙයිගේ වදන් තුලින් උපුටා ගත් කොටසක 'ප්‍රශංසා කිරීම යනු, අන්‍යයන්ගේ බුද්ධ ස්වභාවය විශ්වාස කිරීමයි' ලෙසින් කියාදුන්නා.

එම කොටස කියවමින්, මට මතකයට නැගුනේ නිර්මාතෘ තුමාගේ ධර්ම දේශනාවක් තුල තිබුන, 'සත්‍ය අවබෝධ කරගැනීම යනු, පුද්ගලයන්ගේ හදවතට සැහැල්ලුව හා බලාපොරොත්තු ලබාදීම වේ' යන කොටසයි. මනුෂ්‍යයන් මානසික වශයෙන් දියුණුවීමට නම්, අභිලාශයන්ගේ වර්ධනය කරගැනීමට පාදක වන සබැඳියාවන්, එනම් සතුට, ධෛර්යය, සැහැල්ලුව හා බලපොරොත්තු යන කරුණු අත්‍යාවශ්‍ය බව තවත් හොඳින්ම වැටහුනා.


නික්යෝ නිවානෝ නිර්මාතෘ තුමා ජීවත්ව සිටින කාලයේදී, 'සෑම මනුෂ්‍යයෙකු සමඟින් හොඳින් සබඳතා පවත්වා ගැනීමට හැකි පුද්ගලයෙකු වනවා යනු, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හොඳින් අවබෝධ කරගත් පුද්ගලයෙකු වන බවයි' සේ නිරන්තරයෙන් අපව දිරිමත් කලා. එනම් දිනපතා සිදුවන හමුවීම්, 'අන්‍යයන් ගැන සිතනා හදවතින්, මානව සම්පත් දියුණුවට සාධකයක්' බවට පත්කර ගන්නේ? ඒ විමසීම මටම නිරන්තරයෙන් කරමින්, මේ මාසයේදීත් හමුවන සෑම හමුවීමක් සමඟම හොඳින් කටයුතු කරමින්, මම සිටිනා තැන ධර්මය පුහුණුවන ස්ථානයයි ලෙස භාරගනිමින් ඉතා කැපවීමෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.



ඇමෙරිකාවේ, චිකාගෝ ශාඛාවේ ධර්ම නායිකා, කයෝ මුරකමි මහත්මිය (මැද පේළියේ මැද) හා පවුලේ සාමාජිකයන් අන්තර් ජාතික මූලස්ථානයට පැමිණි දිනයේදී (අකගාවා මහතා මැද පේළියේ වම්පස කෙළවරේ)




# A Global Buddhist Movement




Information about local Dharma centers

facebook

X

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp